# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 898/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 28/05/2024<br>පැය 1020 |

## මාධ්‍ය නිවේදනය

### විෂ මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම - පොලිස් මූලස්ථානය.

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදා හරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2023.12.17 වන දින සිට විශේෂ මෙහෙයුම් ආරම්භ කර ඇත.

එයට සමගාමීව 2024.05.27 වන දිනය තුල සිදු කරන ලද මුළු වැටලීම් 728 කට අදාලව සැකකරුවන් 717 ක් හා සැකකාරියන් 10 ක් අත්අඩංගුවට ගෙන ඇත. ඉන් සැකකරුවන් 28 ක් වැඩිදුර විමර්ශන සඳහා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට නියමිතව ඇති අතර එක් සැකකරුවෙක් වත්කම් විමර්ශනය සඳහා නියමිතයි. සැකකරුවන් 06 ක් පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

**මෙම මෙහෙයුමේදී බස්නාහිර පළාත ආවරණය වන පරිදි සිදුකරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වලදී හෙරොයින් ග්‍රෑම් 180 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 140 ක්, ගංජා ග්‍රෑම් 307 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 449 කදී සැකකරුවන් 445 ක් හා සැකකාරියන් 04 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**මෙම මෙහෙයුමේදී දකුණු පළාත ආවරණය වන පරිදි සිදුකරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වලදී හෙරොයින් ග්‍රෑම් 24 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 ක් හා ගංජා ග්‍රෑම් 70 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 73 කදී සැකකරුවන් 70 ක් හා සැකකාරියන් 02 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

වැටලීමට අදාල විශේෂිත සංඛ්‍යා තොරතුරු පහත සඳහන් කර ඇත.

**2024.05.27 වන දින දිවයින තුල සිදු කරන ලද වැටලීම් සම්බන්ධ වාර්තාව.**

| | | |
|---|---|---|
| හෙරොයින් | ප්‍රමාණය (g / mg) | 289.697 |
| අයිස් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 461.083 |
| ගංජා | ප්‍රමාණය (g /mg) | 2039.401 |
| මත්පෙති | ප්‍රමාණය | 84 |
| වෙනත් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 4471.66 |
| මුළු වැටලීම් ගණන | | 728 |
| අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන | ස්ත්‍රී | 10 |
| | පුරුෂ | 717 |
| රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගත් සැකකරුවන් ගණන | | 28 |
| වත්කම් විමර්ශනය සඳහා නියමිත සැකකරුවන් ගණන | | 01 |
| පුනරුත්ථාපනය සඳහා යොමු කරන ලද සැකකරුවන් ගණන | | 06 |
| නීති විරෝධි මත්පැන් | ප්‍රමාණය (ලීටර්) | 2958 |
| ගෝඩා | ප්‍රමාණය (ලීටර්) | 11334 |

**2024.05.27 වන දින අත්අඩංගුවට ගත් වරෙන්තුකරුවන් සම්බන්ධව වාර්තාව.**

| | |
|---|---|
| විෂ මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් ගණන | 02 |
| විෂ මත්ද්‍රව්‍ය නොවන වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් විවෘත වරෙන්තුකරුවන් ගණන | 39 |

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**